# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

2020 ජනවාරි


වෙළුම 02 නිකුතුව 01

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2020 ජනවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,005 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.2 කින් පහත වැටුණි.

2020 ජනවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,735 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.8 කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2020 ජනවාරි මාසයේදී අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.2 කින් පහළ ගිය අතර ආනයන වියදම සියයට 4.8 කින් ඉහළ ගියේය.


2019 ජනවාරි මාසයට සාපේක්ෂව 2020 ජනවාරි මාසයේදී වෙළඳ හිඟය පුළුල් විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - 2020 ජනවාරි

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

අපනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි




අපනයන පරිමා දර්ශකය - ජනවාරි





2020 ජනවාරි මාසයේදී කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජ යන සියලු ප්‍රධාන කාණ්ඩවල අපනයන පහළ යෑම හේතුවෙන් අපනයන ආදායම පහත වැටුණි.


කාර්මික අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් 2020 ජනවාරි මාසයේදී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


කෘෂිකාර්මික අපනයන ආදායම





කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශක සහ මිල දර්ශක




කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය - ජනවාරි




තේ සහ රබර් මිල ගණන් *





*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වේ


ප්‍රධාන වශයෙන් තේ, කුළුබඩු සහ මුහුදු ආහාර අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් 2020 ජනවාරි මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, මෙම මාසය තුළදී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

# කාර්මික අපනයන


කාර්මික අපනයන ආදායම





කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය
ජනවාරි





නැව් හා ගුවන් යානා ඉන්ධනවල
අපනයන මිල ගණන්





ආහාර, පාන වර්ග හා දුම්කොළ, රබර් නිෂ්පාදිත, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයනවල ක්‍රියාකාරිත්වය පහළ යෑම හේතුවෙන් 2020 ජනවාරි මාසය තුළදී කාර්මික අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයන පරිමා හා මිල ගණන් මෙන්ම නැප්තා අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් නැව් හා ගුවන් යානා සඳහා යොදාගනු ලබන ඉන්ධන අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

ආනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි





ආනයන පරිමා දර්ශකය - ජනවාරි





අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හමුවේ වුවද ප්‍රධාන වශයෙන් පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2020 ජනවාරි මාසය තුළදී ආනයන වියදම ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය - ජනවාරි





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





විශේෂයෙන්ම පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත වැනි ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන මෙන්ම කිරි නිෂ්පාදිත සහ සීනි වැනි ආහාර අයිතම ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2020 ජනවාරි මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
ජනවාරි





බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන්
(මාසික සාමාන්‍ය අගයන්)





ප්‍රධාන වශයෙන් ඉන්ධන, මූල ලෝහ, තිරිඟු හා ඉරිඟු සහ ඛනිජමය නිෂ්පාදිත ආනයන පහළ යෑම හේතුවෙන් 2020 ජනවාරි මාසයේදී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, මෙම මාසයේදී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය - ජනවාරි




ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ප්‍රවාහන උපකරණ ආනයන ඉහළ යෑම හේතුවෙන් 2020 ජනවාරි මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය අතර ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහත වැටුණි.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | 2019 | වෙනස (%) 2019/18 | ජන. - 19 | ජන. - 20 | වෙනස (%) ජන.20/ජන.19 |
|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **2,461.9** | **-4.6** | **207.6** | **188.7** | **-9.1** |
| එයින් | තේ | 1,346.4 | -5.7 | 110.8 | 99.7 | -10.0 |
| | පොල් | 329.5 | 6.0 | 25.7 | 24.6 | -4.5 |
| | කුළුබඩු | 312.5 | -13.2 | 27.8 | 19.5 | -30.0 |
| | මුහුදු ආහාර | 262.5 | -1.3 | 27.4 | 23.7 | -13.5 |
| **කාර්මික අපනයන** | | **9,426.3** | **1.8** | **826.4** | **812.6** | **-1.7** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 5,596.5 | 5.2 | 475.9 | 474.0 | -0.4 |
| | රබර් නිෂ්පාදිත | 866.1 | -1.1 | 80.7 | 70.2 | -13.0 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 521.1 | -16.2 | 37.5 | 82.8 | 120.9 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 447.0 | -3.3 | 53.1 | 35.5 | -33.2 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 400.0 | -8.0 | 36.8 | 30.5 | -17.2 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 305.7 | 10.0 | 24.1 | 24.7 | 2.3 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 102.9 | -30.3 | 13.1 | 5.6 | -57.6 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **51.8** | **-0.8** | **4.1** | **3.6** | **-13.0** |
| **මුළු අපනයන** | | **11,940.0** | **0.4** | **1,038.1** | **1,004.9** | **-3.2** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | 2019 | වෙනස (%) 2019/18 | ජන. - 19 | ජන. - 20 | වෙනස (%) ජන.20/ජන.19 |
|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **3,956.5** | **-20.5** | **300.5** | **371.8** | **23.7** |
| ආහාර හා පාන වර්ග | | 1,426.9 | -11.2 | 111.2 | 147.5 | 32.7 |
| එයින් | සහල් | 12.8 | -88.0 | 2.3 | 2.2 | -7.5 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 2,529.6 | -25.0 | 189.3 | 224.2 | 18.4 |
| එයින් | පෞද්ගලික රථවාහන | 815.7 | -48.2 | 49.5 | 63.3 | 27.8 |
| **අන්තර් භාණ්ඩ** | | **11,369.6** | **-9.0** | **956.1** | **934.5** | **-2.3** |
| එයින් | ඉන්ධන | 3,891.6 | -6.3 | 329.0 | 291.9 | -11.3 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,909.4 | 1.8 | 262.5 | 300.8 | 14.6 |
| | රසායනික නිෂ්පාදිත | 831.5 | -8.0 | 76.1 | 74.1 | -2.7 |
| | මූල ලෝහ | 562.8 | -17.6 | 46.7 | 25.2 | -46.1 |
| | තිරිඟු හා ඉරිඟු | 346.4 | -7.3 | 14.5 | 8.9 | -38.5 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **4,610.9** | **-90.8** | **398.8** | **429.1** | **7.6** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 2,489.7 | -0.1 | 231.2 | 258.7 | 11.9 |
| **මුළු ආනයන** | | **19,937.1** | **-10.3** | **1,655.5** | **1,735.3** | **4.8** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | 2019 | වෙනස (%) 2019/18 | ජන. - 19 | ජන. - 20 | වෙනස (%) ජන.20/ජන.19 |
|---|---|---|---|---|---|
| වෙළඳ ශේෂය | -7,997.1 | | -617.3 | -730.4 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (අ)

| කාණ්ඩය | | 2019 | වෙනස (%) 2019/18 | ජන. - 19 | ජන. - 20 | වෙනස (%) ජන.20/ජන.19 |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 138.5 | 0.4 | 144.5 | 139.9 | -3.2 |
| | පරිමා දර්ශකය | 147.2 | 7.2 | 146.2 | 150.5 | 2.9 |
| | මිල දර්ශකය | 94.1 | -6.3 | 98.8 | 92.9 | -6.0 |
| **ආනයන** | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 148.7 | -10.3 | 148.2 | 155.3 | 4.8 |
| | පරිමා දර්ශකය | 164.2 | -5.8 | 161.3 | 173.1 | 7.3 |
| | මිල දර්ශකය | 90.5 | -4.8 | 91.9 | 89.7 | -2.3 |
| **වෙළඳ මිල අනුපාතය** | | 103.9 | -1.6 | 107.6 | 103.6 | -3.7 |

(අ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද